සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය **පුරවැසි අධ්‍යාපනය - I** කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලුවක් වන්නේ,
(1) වර්තමාන රාජ්‍යවල භූමිය කුඩා වීම ය.
(2) වර්තමාන රාජ්‍යවල අධික ජනගහනයක් සිටීම ය.
(3) සමාජ අවශ්‍යතා සීමිත වීමය.
(4) පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමට පහසු වීමය.

02. රාජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂාවන් ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන නියෝජිතයා වන්නේ,
(1) විධායකයයි. (2) ව්‍යවස්ථාදායකයයි. (3) ආණ්ඩුවයි. (4) අධිකරණයයි.

03. දේශපාලන සංවිධානයක් ලෙස ජාතික රාජ්‍යයන් යුරෝපය තුළ ආරම්භ වූයේ,
(1) 13 වන සියවසෙන් පසුව ය. (2) 14 වන සියවසෙන් පසුව ය.
(3) 12 වන සියවසෙන් පසුව ය. (4) 15 වන සියවසෙන් පසුව ය.

04. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දේශපාලන විධායකයට හිමි වන බලතල ක්‍රියාවට නංවනු ලබන්නේ,
(1) ජනාධිපතිය (2) අගමැතිය
(3) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය (4) ජනාධිපති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය

05. මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ආණ්ඩු ඒකක වෙත පවරාදීම හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
(1) බලය බෙදාහැරීම නමිනි. (2) බලය විමධ්‍යගත කිරීම නමිනි.
(3) බලය පවරාදීම නමිනි. (4) බලය විතැන් කිරීම නමිනි.

06. ශ්‍රී ලංකාවේ පළාත් සභාවල මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා යන ආයතන දෙවර්ගයටම සමසේ භුක්ති විඳිය හැකි බලතල ඇතුලත් වන්නේ මින් කුමන ලැයිස්තුවේ ද?
(1) සමගාමී ලැයිස්තුවේ ය. (2) සංවෘත ලැයිස්තුවේ ය.
(3) මධ්‍යම ආණ්ඩුවේ ලැයිස්තුවේ ය. (4) පළාත් සභා ලැයිස්තුවේ ය.

- **පහත සඳහන් ප්‍රකාශවලට අදාළව 07 සහ 08 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A විධායක බලතල ජනාධිපති විසින් ක්‍රියාවට නංවයි.
B ව්‍යවස්ථාදායකය සන්ධීය මහා මණ්ඩලය ලෙස හඳුන්වයි.
C මහජන අදහස් විමසීමට ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම නිතර යොදාගනියි.
D කොංග්‍රස් මණ්ඩලය ද්වි මාණ්ඩලික වේ.
E සෙනෙට් සභාව නියෝජිතයින් 100 කින් සමන්විත වේ.
F කැන්ටන්වලට ස්වාධීනව කටයුතු කිරීමේ අවස්ථාව අහිමි වේ.

07. ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහයේ ලක්ෂණ ඇතුලත් පිළිතුර තෝරන්න.
(1) ABC (2) ADE (3) ABF (4) ACD

08. ස්විස්ටර්ලන්ත ආණ්ඩුක්‍රමයේ දක්නට ලැබෙන ලක්ෂණ ඇතුලත් පිළිතුර තෝරන්න.
(1) BCD (2) CDF (3) BCF (4) ADF

09. යහපාලනය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
   (1) රාජ්‍ය ප්‍රතිපත්ති විනිවිද භාවයෙන් යුක්තව ක්‍රියාත්මක කිරීමයි.
   (2) ජනතා සුබසිද්ධිය උපරිම වන අයුරින් පුරවැසි අයිතීන් හා සමාජ සාධාරණත්වය ආරක්ෂා වන පරිදි වගවීමෙන් යුක්තව කටයුතු කිරීමයි.
   (3) වංචාවෙන් හා දූෂණයෙන් තොරව පාලන කටයුතු සිදු කිරීමයි.
   (4) සමාජ සාධාරණත්වයෙන්, වංචාවෙන් හා දූෂණයෙන් තොරව රට පාලනය කිරීමයි.

10. වර්තමානයේ බොහෝ සංවර්ධිත රටවල් සමාජ, ආර්ථික හා දේශපාලන ක්‍රියාවලියේ දී බහු සංස්කෘතික භාවය හොඳින් ප්‍රයෝජනයට ගන්නා බවට දිය හැකි හොඳම නිදසුන වන්නේ,
   (1) එක් ජාතියකට එක් රාජ්‍යයක් යන තේමාව මත කටයුතු කිරීමයි.
   (2) එක සංස්කෘතියකට එක් රාජ්‍යයක් යන තේමාව යටතේ කටයුතු කිරීමයි.
   (3) වෙනස්කම් තුළින් එකමුතු බව තේමාව යටතේ කටයුතු කිරීමයි.
   (4) සංස්කෘතික විවිධත්වය යන තේමාව යටතේ කටයුතු කිරීමයි.

11. පුද්ගලයාගේ සියලුම අවශ්‍යතා හා වුවමනාවන් ඉටු කිරීමට නොහැකි නිසා මුලින්ම තීරණය කළ යුත්තේ,
   (1) කොපමණ නිෂ්පාදනය කරන්නේ ද යන්න ය.
   (2) කෙසේ නිෂ්පාදනය කරන්නේ ද යන්න ය.
   (3) කා හට නිෂ්පාදනය කරන්නේ ද යන්න ය.
   (4) කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේ ද යන්න ය.

12. නිෂ්පාදනයේ දී පිරිවැයක් දැරීමට සිදුවන සහ පරිභරණය සඳහා මිලක් ගෙවීමට සිදුවන භාණ්ඩ,
   (1) ආර්ථික භාණ්ඩ ලෙස හැඳින්වේ. (2) ප්‍රාග්ධන භාණ්ඩ ලෙස හැඳින්වේ.
   (3) අන්තර් භාණ්ඩ ලෙස හැඳින්වේ. (4) පාරිභෝගික භාණ්ඩ ලෙස හැඳින්වේ.

13. මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් ක්‍රියා කරන දේපල පොදු අයිතිය යටතේ පවතින ආර්ථික සංවිධාන ක්‍රමය හඳුන්වන්නේ,
   (1) ධනවාදී අර්ථ ක්‍රමය නමිනි. (2) සමාජවාදී අර්ථ ක්‍රමය නමිනි.
   (3) වෙළඳපොළ අර්ථ ක්‍රමය නමිනි. (4) මිශ්‍ර අර්ථ ක්‍රමය නමිනි.

14. රටක් සංවර්ධනය සඳහා යන ගමනේදී ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටුකර ගැනීම හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
   (1) ආර්ථික සංවර්ධනය ලෙසය. (2) සමාජ සංවර්ධනය ලෙසය.
   (3) තිරසාර සංවර්ධනය ලෙසය. (4) ජාතික සංවර්ධනය ලෙසය.

15. ලෝකයම එකම භාෂාවක් කථා කරන එකම මුදල් ඒකකයක් භාවිතා කරන තනි ජාතියක් බවට පත් විය යුතු බව පෙන්වා දෙන්නේ,
   (1) සාර්ක් සංවිධානයයි. (2) යුරෝපා සංගමයයි.
   (3) එක්සත් ජාතීන්ගේ සංවිධානයයි. (4) ලෝක බැංකුවයි.

- **පහත සඳහන් ප්‍රකාශ අදාළ කරගෙන 16 සහ 17 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

   A විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලාඒම.
   B බුද්ධි ගලනය වේගවත් වීම.
   C දේශීය සංස්කෘතියට බලපෑම් එල්ල වීම.
   D විවිධ කලාපීය සංවිධාන හා එකතුවීමට හැකිවීම.
   E දේශීය යැපුම් ආර්ථික රටාව විනාශ වීම.
   F ආර්ථිකය විවිධාංගීකරණය වීම.

16. ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන ධනාත්මක බලපෑම් ඇතුලත් පිළිතුර තෝරන්න.
   (1) ABC (2) CDE (3) BDE (4) ADF

17. ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන සෘණාත්මක බලපෑම් ඇතුලත් පිළිතුර තෝරන්න.
   (1) BCD (2) ABD (3) CDE (4) BCE

18. ශ්‍රී ලංකාවේ 1970 - 1977 දක්වා කාලය තුළ පැවති ආර්ථිකය තුළ දක්නට ලැබුණු ලක්ෂණයක් වන්නේ,
   (1) ආනයන ආදේශන කර්මාන්ත ඇරඹීමයි. (2) විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමයි.
   (3) ආනයන අපනයන සීමා ලිහිල් කිරීමයි. (4) කාර්මික අංශයට වැඩි සැලකිල්ලක් දැක්වීමයි.

19. පහත ''අ'' තීරුවෙන් දක්වෙන්නේ ගැටුම් නිරාකරණය කිරීමේ විධික්‍රමය. ''ආ'' තීරුවෙන් දක්වෙන්නේ ගැටුම් නිරාකරණ ක්‍රමවල ලක්ෂණයන් ය. මේවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ''අ'' | | ''ආ'' | |
|---|---|---|---|
| 1. | සමථකරණය | A | විත්තිකරු අධිකරණයෙහි පෙනී සිටිය යුතුවීම. |
| 2. | සාකච්ඡා කිරීම | B | ප්‍රතිවිරුද්ධ පක්ෂයන් අතර සංවාදයක් ගොඩනැගීම. |
| 3. | කේවල් කිරීම | C | සේව්‍ය සේවක දෙපාර්ශවයකින් යුක්ත වීම. |
| 4. | විනිසිම | D | වියදම් අවම ක්‍රමයක් විම. |

(1) ABCD (2) BCDA (3) CDAB (4) ADBC

20. පහත දක්වෙන්නේ ගැටුම් නිරාකරණයේ දී පුද්ගලයෙකු සතු විය යුතු පුද්ගල ගුණාංග හා සමාජීය ගුණාංගයන්ය . මෙයින් සමාජීය ගුණාංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A නිර්මාණාත්මක චින්තනය
B අන් අයට ගරු කිරීම
C ඵලදායී සන්නිවේදනය
D යුතුකම් ඉටු කිරීම
E සවන්දීම

(1) ABC (2) ADC (3) BDE (4) BCD

21. නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,
(1) රටක සාමය හා සුරක්ෂිත භාවය ඇතිකිරීමයි.
(2) රටක ජනතාවගේ ජීවිත, අයිතිවාසිකම් හා දේපල ආරක්ෂා වන අයුරින් මානව හැසිරීම් පාලනය කිරීම තුළින් යුක්තිය ඇති කිරීමයි.
(3) රටක් නීතියට අනුව පාලනය කිරීමයි.
(4) නීතියට ගරු කිරීම හා අවනත වීමයි.

22. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ ඉහළම උසාවියකින් දෙනු ලබන තීන්දුවකට එරෙහිව අභියාචනා ඉදිරිපත් කළ හැකි වූයේ කිනම් අධිකරණයකට ද?
(1) එංගලන්තයේ ශ්‍රේෂ්ඨාධිකරණයට ය. (2) එංගලන්තයේ මහාධිකරණයට ය.
(3) එංගලන්තයේ අපරාධ උසාවියට ය. (4) එංගලන්තයේ රාජාධිකරණයට ය.

23. ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රධානියා වන්නේ,
(1) නීතිපතිතුමා ය. (2) අග්‍රවිනිශ්චයකාරවරයා ය.
(3) අධිකරණ අමාත්‍යවරයා ය. (4) ජනාධිපතිවරයා ය.

24. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනයක් වන්නේ,
(1) අභියාචනාධිකරණයයි. (2) පළාත් බඳ මහාධිකරණයයි.
(3) අධිකරණ සේවා කොමිෂමයි. (4) ශ්‍රේෂ්ඨාධිකරණයයි.

25. මානව හිමිකම් කොමිෂමේ සාමාජිකයන් පත්කරනු ලබන්නේ,
(1) ජනාධිපති විසිනි. (2) අගමැති විසිනි.
(3) අග්‍රවිනිශ්චයකාරවරයා විසිනි. (4) කැබිනට් මණ්ඩලය විසිනි.

26. අධිකරණ සේවා කොමිෂම සමන්විත වන සාමාජිකයන් ගණන වන්නේ,
(1) විසිදෙනෙකි. (2) පස්දෙනෙකි. (3) දහසයදෙනෙකි. (4) තුන්දෙනෙකි.

27. බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලාංකිකයින්ට දේශපාලනයට මැදිහත්වීමට වැඩි අවස්ථාවක් උදා වූයේ,
(1) 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගිනි. (2) 1921 මැනිං ප්‍රතිසංස්කරණ මගිනි.
(3) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගිනි. (4) 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණ මගිනි.

28. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට විධායක බලය සහිත ජනාධිපති ධූරයක් නිර්මාණය කළ ආණ්ඩු ක්‍රමය කුමක් ද?
(1) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයයි. (2) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමයයි.
(3) 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රමයයි. (4) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයයි.

29. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මෙරට නීති සම්පාදනය කරන ආයතනය හඳුන්වන්නේ කුමන නමකින් ද?
(1) ජාතික රාජ සභාව නමිනි. (2) පාර්ලිමේන්තුව නමිනි.
(3) රාජ්‍ය මන්ත්‍රණ සභාව නමිනි. (4) සෙනෙට් සභාව නමිනි.

30. මානව හිමිකම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මානව අයිතිවාසිකම් භුක්තිවිදීමට ලැබෙන සමාජයක මිනිස් ජීවිත සුරක්ෂිතව පවත්වාගෙන යාම දුෂ්කර වේ.
(2) ජාතිය, ආගම, භාෂාව සහ දරන දේශපාලන මතය ආදිය සලකා පොදුවේ සැමට හිමිවන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් වේ.
(3) සෑම මානව අයිතිවාසිකමක්ම මූලික අයිතිවාසිකමක් වේ.
(4) මානව අයිතිවාසිකම් විශ්වමය සංකල්පයක් වන අතර එය සාධාරණත්වය හා සමානාත්මතා මූලධර්මය මත පදනම් වේ.

31. මරණ දඬුවම අහෝසි කිරීම අරමුණු කොටගෙන එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් පිහිටුවා ඇති සම්මුතිය වන්නේ,
   (1) ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියයි.
   (2) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට එකතු කළ දෙවන වෛකල්පිත සමමුතියයි.
   (3) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියයි.
   (4) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පිත සම්මුතියයි.

32. සෑම වර්ෂයකම ජගත් මානව හිමිකම් දිනය ලෙස සමරන්නේ,
   (1) දෙසැම්බර් 10 වන දිනය  (2) පෙබරවාරි 10 වන දිනය
   (3) දෙසැම්බර් 21 වන දිනය  (4) පෙබරවාරි 21 වන දිනය

33. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැකසීමේ දී සැලකිල්ලට ගෙන ඇති ලේඛනයක් වන්නේ මින් කුමක් ද?
   (1) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය
   (2) ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනය
   (3) දණ්ඩ නීති සංග්‍රහය
   (4) සීඩෝ සම්මුතිය

34. අපට පරිසරයෙන් ලැබෙන ජීව උපකාරක සේවාවන් ඇතුලත් පිළිතුර තෝරන්න.
   (1) හිරු එළිය, ඛනිජ සම්පත්, වාතය  (2) හිරු එළිය, වාතය, ජලය
   (3) දැව, ශාක, සත්ව ආහාර  (4) භූමිය, ජලය, වාතය

35. පාරිසරික ගැටලු ඇතිවීම සඳහා මුල්වන ප්‍රධානම හේතුව වන්නේ,
   (1) සම්පත් අධි ලෙස පරිභෝජනය කිරීමයි.
   (2) පරිසරය තුළ ස්වභාවික විපත් ඇතිවීමයි.
   (3) මිනිසුන්ගේ දිළිඳුකම නිසායි.
   (4) සම්පත් අසීමිත ලෙස කැනීම්වලට ලක්වන නිසායි.

36. ''අ'' කොටසේ ක්‍රියාකාරීත්වයන් නිසා ඇතිවන ප්‍රතිඵල ''ආ'' කොටසේ දක්වේ. ගැලපෙන පිළිතුර තෝරන්න.

| ''අ'' කොටස | | ''ආ'' කොටස | |
|---|---|---|---|
| 1. | වන හායනය නිසා | A | සමාජ සබඳතා බිඳවැටේ. |
| 2. | වායු දූෂණය නිසා | B | ජලජ ජීවීන් මිය යයි. |
| 3. | සමාජ පරිසරයට සිදුවන හානි නිසා | C | හිම කඳු දියවේ. |
| 4. | ජල දූෂණය නිසා | D | භූගත ජල මට්ටම පහළ යයි. |

   (1) ABCD  (2) BCDA  (3) CDBA  (4) DCAB

37. වර්තමාන ලෝකයේ සංවර්ධිත රටවලට මුහුණ පෑමට සිදු **නොවන** ගැටලුවක් වන්නේ,
   (1) අවාසිදායක වෙළඳ ශේෂය  (2) වෙළඳපොළ තරගය
   (3) ජාත්‍යන්තර ත්‍රස්තවාදය  (4) බලශක්ති අර්බුදය

38. රටක රාජ්‍ය උපාය සම්බන්ධතා ගොඩනැගීම සඳහා මඟපෙන්වනු ලබන්නේ,
   (1) එරට තානාපති සේවයයි.  (2) එරට අන්තර්ජාතික වෙළඳාමයි.
   (3) එරට විදේශ ප්‍රතිපත්තියයි.  (4) එරට ජාත්‍යන්තර වෙළඳාමයි.

39. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරිපාලන ආයතනය වේ.
   (2) එක්සත් ජාතීන්ගේ ප්‍රධානතම අධිකරණ ආයතනය වේ.
   (3) ස්ථාවර සාමාජිකයන් පස්දෙනෙකුගෙන් හා ස්ථාවර නොවන සාමාජිකයන් 10 කින් සමන්විත වේ.
   (4) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අයවැය ලේඛනය සකසයි.

40. ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප ඇතුලත් පිළිතුර තෝරන්න.
   (1) ජාත්‍යන්තර වෙළඳාම හා රාජ්‍ය උපාය සබඳතා  (2) රාජ්‍ය උපාය සබඳතා හා යුධ උපාය සබඳතා
   (3) ජාතික ආරක්ෂාව හා යුධ උපාය සබඳතා  (4) ජාත්‍යන්තර වෙළඳාම හා යුධ උපාය සබඳතා

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය**

# පුරවැසි අධ්‍යාපනය - II

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක්ද සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) (i) රාජ්‍යයේ භූමිකාවට අනුව රාජ්‍යයට පැවරෙන කාර්යයන් 2 ක් ලියන්න.

(ii) ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්‍ෂණ 2 ක් ලියන්න.

(iii) බහු සංස්කෘතික ජන සමාජයක ජීවත් වන පුරවැසියන් එක්සත්ව ජීවත්වීමෙන් ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න.

(iv) වර්තමානයේ ක්‍රියාත්මක වන නව ලිබරල්වාදී වෙළඳපොළ ආර්ථික ක්‍රමයක මූලික ලක්‍ෂණ 2 ක් ලියන්න.

(v) ගැටුම් ඇතිවීමට බලපාන ප්‍රධාන මූල 2 ක් ලියන්න.

(vi) නීතිපති තුමාගේ බලතල හා කාර්යයන් ඉටුකිරීම සඳහා සහය වන නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න.

(vii) 1972 පළමු ජන රජ ආණ්ඩුක්‍රමය තුළ දක්නට ලැබුණු ලක්ෂණ 2 ක් ලියා දක්වන්න.

(viii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුගේ මානව අයිතිවාසිකමක් කඩවූ විට ගත හැකි ක්‍රියා මාර්ග 2 ක් ලියන්න.

(ix) පරිසරයේ ගුණාත්මක භාවය රැක ගැනීම සඳහා රජය විසින් අනුගමනය කරන ආරක්‍ෂණ හා උපාය මාර්ග 2 ක් ලියන්න.

(x) ප්‍රබල රාජ්‍යයන් විසින් බලයෙන් අඩු රාජ්‍යයන් වෙත බලපෑම් එල්ල කරන ක්‍ෂේත්‍ර 2 ක් ලියන්න. (ලකුණු 2 x 10 = 20)

02 ''ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ රටේ පාලනය සිදුවන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ය.

(i) වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම වර්ග 2 ක් ලියන්න. (ල. 02)

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීමේ දී එයට ඇතුලත් කළ යුතු කරුණු 3 ක් ලියන්න. (ල. 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 3 ක් ලියා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

03 ''ආණ්ඩුවේ විවිධ ස්තරයන් වන මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූලික වගකීම වන්නේ නීතිය හා සාමය පවත්වාගෙන යමින් ජනතා අවශ්‍යතා උපරිම අයුරින් ඉටු කර දීමයි.''

(i) පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන 2 ක් ලියන්න. (ල. 02)

(ii) A පළාත් සභාවක නාමික විධායකය ලෙස කටයුතු කරන්නේ කවුද?

B මහ නගර සභාවක ප්‍රධානියා නම් කරන්න.

C ප්‍රාදේශීය සභාවක ප්‍රධානියා නම් කරන්න. (ල. 03)

(iii) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් ප්‍රධාන තේමා 3 ක් යටතේ ගොනු කර ඇත. එම ප්‍රධාන තේමා 3 නම් කර ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 05)

04 ''රටවල් අතර පවත්නා ගැටුම් අන්තර්ජාතික ගැටුම් ලෙස හඳුන්වයි.''

(i) අන්තර්ජාතික ගැටුම්වල ප්‍රධාන කොටස් 2 ලියන්න. (ල. 02)

(ii) ගැටුම් ඇතිවිය හැකි පාර්ශව 3 ක් නම් කරන්න. (ල. 03)

(iii) ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීමේ වාසි 3 ක් ලියා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

05 ''නීතියේ ආධිපත්‍ය යනු රටක පාලනය නීතියේ උත්තරීතර භාවයට අනුව සිදු කිරීමයි.''

(i) නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)

(ii) නීතියේ ආධිපත්‍යයට බලපාන ගුණාංග 3 ලියන්න. (ල. 03)

(iii) අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීමේ වැදගත්කම කරුණු 3 ක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

06 ''අයිතිවාසිකම් යන්න ඉතා පුළුල් සංකල්පයකි.''

(i) මානව අයිතිවාසිකම් බෙදා දැක්විය හැකි කොටස් 2 ලියන්න. (ල. 02)

(ii) ළමා අයිතිවාසිකම් සම්මුතියේ දැක්වෙන මූලධර්ම 3 ක් ලියන්න. (ල. 03)

(iii) වැඩිහිටියන් (ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ) අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග 3 ක් ලියා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

07 ''රටක් අත්පත් කරගෙන ඇති ප්‍රගතිය හා මට්ටම බැලීම සඳහා එම රටෙහි විවිධ පැතිකඩයන් මැනීමකට ලක් කළ යුතුය.''

(i) සංවර්ධනය මැනීමේ පරමාර්ථ 2 ක් ලියන්න. (ල. 02)

(ii) සංවර්ධනය මැනීම සඳහා යොදාගන්නා නූතන මිනුම් 3 ක් ලියන්න. (ල. 03)

(iii) ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමෙහිලා බලපාන සාධක 3 ක් ලියා එකක් විස්තර කරන්න. (ල. 05)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2019**

**11 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(4) | 4 -(4) | 5 -(1) | 6 -(1) | 7 -(2) | 8 -(3) | 9 -(2) | 10 -(3) |
| 11-(4) | 12 -(1) | 13 -(2) | 14 -(3) | 15 -(2) | 16 -(4) | 17 -(4) | 18 -(1) | 19 -(2) | 20 -(3) |
| 21-(2) | 22 -(4) | 23 -(2) | 24 -(3) | 25 -(1) | 26 -(4) | 27 -(3) | 28 -(2) | 29 -(2) | 30 -(4) |
| 31-(2) | 32 -(1) | 33 -(2) | 34 -(2) | 35 -(1) | 36 -(4) | 37 -(1) | 38 -(3) | 39 -(3) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) * නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
* සමාජ සුභසාධන සේවා සැපයීම.
* පොදු සේවා පවත්වාගෙන යාම.
* සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම... යනාදිය (පිටුව 19)

(ii) * නීති පැනවීම සම්බන්ධයෙන් උත්තරීතර වන්නේ ව්‍යවස්ථාදායකයයි.
* ස්වාධිපති බලය මධ්‍යම ආණ්ඩුව වෙත ඒකරාශී වීම.
* ත්‍රිවිධ බලතල මධ්‍යම ආණ්ඩුව වෙත කේන්ද්‍රගතව පැවතීම.

(iii) * ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.
* ගැටුම් අවම වේ.
* එක් ජාතියක් එක් රටක් යන හැඟීම වර්ධනය වේ.
* මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ. .... යනාදිය (පිටුව 67)

(iv) * රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම.
* වෙළඳපොල තත්වය මත මිල තීරණය වීම.
* ආයෝජකයන් දිරිගැන්වීම.
* සහනාධාර හා මිල පාලන ක්‍රම ලිහිල් කිරීම.
* පෞද්ගලික දේපල අයිතියට ඉඩදීම... යනාදිය (පිටුව 78)

(v) වාර්ගිකත්වය, දේශපාලනය, ආගමික මතවාද, සමාජ ආර්ථික තත්වය

(vi) සොලිස්ටර් ජෙනරාල්, අතිරේක සොලිස්ටර් ජනරාල්, රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරු (පිටුව 16)

(vii) * ඩොමිනියන් තත්වය අහෝසි කර ස්වාධීන ජනරජයක් බවට පත් කිරීම.
* නාමික ජනාධිපතිධූරයක් හඳුන්වාදීම.
* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය පිහිටුවීම.
* මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කිරීම.

(viii)* ශ්‍රේෂ්ඨාධිකරණයට දැන්වීම.
* මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කිරීම.
* පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත පැමිණිලි කිරීම... (75 පිටුව)

(ix) * සංවර්ධන කටයුතුවලදී පරිසර පිරිවැය තක්සේරු කිරීම.
* පරිසර හිතකාමී පුරවැසියන් බිහි කිරීම.
* පරිසරය සම්බන්ධ නීති පැනවීම.
* පුරවැසි ආකල්ප සංවර්ධනය කිරීම.
* පරිසර ප්‍රමිතීන් හඳුන්වා දීම.

(x) * අන්තර් ජාතික වෙළඳාම
* ණය හා ආධාර දීම
* ආර්ථික සංවර්ධනය
* ආරක්ෂක ක්ෂේත්‍රය
* රැකියා සැපයීම

02 (i) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය / ජනාධිපති ආණ්ඩුක්‍රමය

(ii) * ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන නිර්මාණය වන ආකාරය
* එම ආයතනවල කාර්යභාරය
* එම ආයතනවල සම්බන්ධතාවයේ ස්වරූපය
* ආණ්ඩුව හා පුරවැසියා අතර ඇති සම්බන්ධය
* මූලික අයිතිවාසිකම්
* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන ආකාරය

(iii) * පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම.
* අයිතිවාසිකම් පිළිබඳ පාලක හා පාලිත දෙපක්ෂය දැනුවත් වීම.
* අත්තනෝමතික පාලනය වළක්වා ගත හැකි වීම.
* මූලික අයිතිවාසිකම් ආරක්ෂා වීම.
* නීතියේ රැකවරණය සැමට සමානව ලැබීම.

03 (i) * මහජන උපයෝගීතා සේවාවන් පහසුවෙන් ලබාගත හැකි වීම.
* ප්‍රාදේශීය නායකයින් හා ජාතික නායකයින් බිහිවීමට පසුබිම සැකසීම.
* ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ඵලදායී ලෙස ඉටුකිරීම.
* සෞඛ්‍යය හා සනීපාරක්ෂක කටයුතු සංවිධානාත්මකව පවත්වාගෙන යාම..... යනාදිය (පිටුව 41)

(ii) A ආණ්ඩුකාරවරයා B නගරාධිපති/පුරපති C සභාපති

(iii) පොදු මංමාවත් / මහජන සෞඛ්‍යය / පොදු උපයෝගීතා සේවා (විස්තරයට ලකුණු ලබාදෙන්න.)

04 (i) මතවාදී ගැටුම් / යුධමය ගැටුම්

(ii) පුද්ගලයා තුළ / පුද්ගලයින් අතර / ජන කණ්ඩායම් අතර / රටවල් අතර

(iii) * ජීවිත හානි හා දේපල හානි වැළැක්වීම
* අයිතිවාසිකම් ආරක්ෂා වීම
* මානසික ආතතිය අවම වීම
* දේශපාලන හා ආර්ථික ස්ථාවරත්වය ඇතිවීම
* රට සමෘධිමත් වීම .... (පිටුව 107)

05 (i) * ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම.
* නීතිය පිළිබඳ සෑම පුරවැසියෙකුටම අවබෝධයක් තිබීම.
* සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම.
* නීතිය ඉදිරියේ සෑම දෙනාම සමාන වීම.
* නීතිය නොදැන සිටම නිදහසට කරුණක් නොවීම.

(ii) * සෑම කෙනෙක්ම රටේ නීතියට යටත් විම.
* ස්වාධීන අධිකරණයක් මගින් සෑම දෙනාටම සර්ව සාධාරණ හා මානව නීතිය ක්‍රියාත්මක කිරීම.
* අපක්ෂපාතී, නිශ්චිත, සාධාරණ හා යුක්ති සහගත පොදු නිති පද්ධතියක් තිබීම.

(iii) * නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට ඒම.
* අධිකරණය පිළිබඳ මිනිසුන් විශ්වාස නොකිරීම.
* රටතුළ සිදුවන අපරාධ හා දූෂණ වැඩි වීම.
* යුක්තිය ඉටුකර ගැනීමට අනියම් ක්‍රම භාවිතයට පෙළඹීම.
* අධිකරණයට හා නීතියට ඇති ගෞරවය හීන වීම.

06 (i) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් / ආර්ථික සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්

(ii) ළමයාගේ උපරිම යහපත / සහභාගීත්වය / පැවැත්ම හා සංවර්ධනය / වෙනස්කොට නොසැලකීම

(iii) * නොයෙකුත් සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
* තෘප්තිමත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා අවස්ථා සලසා දීම.
* වැඩිහිටියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.... විස්තරයට ලකුණු දෙන්න.

07 (i) * ආර්ථික ප්‍රතිපත්ති සැකසීමට
* සංවර්ධන විෂමතා හඳුනාගැනීමට
* රටවල් සමග සැසඳීමට
* ගැටලු අවබෝධ කර ගැනීමට
* ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීමට

(ii) භෞතික ජීවන තත්ව දර්ශකය / මානව සංවර්ධන දර්ශකය / මානව පීඩන දර්ශකය / දුරකථන ඝනත්වය / පරිගණක සාක්ෂරතාවය .... යනාදිය (106 පිටුව)

(iii) * සම්පත් විසංතුලනය
* අවශ්‍යතා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම.
* අතිරික්ත නිෂ්පාදනය අළෙවි කර ගැනීම
* ප්‍රවාහනයේ හා සන්නිවේදනයේ දියුණුව
* දියුණු තාක්ෂණය ලබාගැනීම
* විපත් අවස්ථාවලදී සහය ලබාගැනීමට (විස්තරයට ලකුණු දෙන්න.)